මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date.

2017 මැයි මස 31

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

අතිගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ 01

අතිගරු ජනාධිපතිතුමනි,

<u>සුළුතර අන්‍යාගමිකයින්ට එරෙහිව පහරදීම්</u>

පසුගිය දින කිහිපය තුලදී අතිශයින් බරපතළ තත්ත්වයට පත්ව ඇති මුස්ලිම් ප්‍රජාව එල්ල කොටගත් ප්‍රචණ්ඩකාරී සහ ආක්‍රමණශීලී ක්‍රියාදාමයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ස්වකීය බලවත් කණස්සල්ල පළ කර සිටී.

මීට පෙර අවස්ථාවක දියත් කරන ලද්දා වූ මේ හා සමාන වූ හැසිරීම්දාමය හේතු කොට ගෙන 2014 ජූනි මාසයේදී අළුත්ගම ප්‍රචණ්ඩත්වයට මග පෑදුණු අතර, එමගින් ජීවිත සහ දේපළවලට වූ හානිය කොමිෂන් සභාව සිහිපත් කළයුතු වේ. එමෙන්ම, අළුත්ගම ප්‍රචණ්ඩකාරීත්වයට පෙළඹවීම් කළ සහ ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරීම්වලට වගකිවයුත්තන් නීතිය ඉදිරිපිටට ගෙනඒම සඳහා අර්ථවත් ක්‍රියාපිළිවෙතක් මෙතෙක් ගෙන නොතිබීමද මෙනෙහි කළයුතු වේ.

මුස්ලිම් ජනතාවගේ ආගමික සිද්ධස්ථානයන් සහ වෙළඳ ව්‍යාපාරවලට විරුද්ධව ප්‍රචණ්ඩත්වය දියත් කිරීම සඳහා ජනතාව පොළඹවාලමින් සමාජ මාධ්‍යජාලයන් සහ සමහර ප්‍රධානතම මාධ්‍ය ජාලයන් ඔස්සේ ප්‍රචාරය කරනු ලබන මුස්ලිම් ප්‍රජාව සහ ඉස්ලාම් ධර්මය ඉලක්ක කරගත් වෛරීය කථනයන් කොමිෂන් සභාවේ දැඩි අවධානයට ලක්වී ඇත.

වගවීමකින් තොරව ක්‍රියාත්මක වන අන්‍යාගම් නොරිස්සීමේ භයානක ප්‍රවණතාවය තුළ ගන්වමින් මෑත අතීතයේදී ක්‍රියාත්මක කරන ලද ක්‍රිස්තියානි ආගමික සිද්ධස්ථානයන්ට එල්ල කරන ලද පහරදීම් මාලාවද අතිගරු ජනාධිපතිතුමන්ගේ කාරුණික අවධානයට ලක් කිරීමට අපි අදහස් කරන්නෙමු.

කිසියම් ප්‍රජාවකට විරුද්ධව එල්ල කරන්නාවූ එවන් වෛරී හා ප්‍රචණ්ඩකාරී කථනයන්, 2007 අංක 56 දරණ සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය ආශ්‍රිත පනත සහ ශ්‍රී ලංකා දණ්ඩනීති සංග්‍රහයෙහි විධිවිධාන යටතේ අපරාධ ලෙස සැලකෙන ක්‍රියාවන් වේ. එවන් ක්‍රියාදාමයන්හි යෙදෙන්නන් අත්අඩංගුවට ගෙන නීතිප්‍රකාරව කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ. පවත්නා නීති ක්‍රියාත්මක නොවී හුදෙක් වචනයට පමණක් සීමාවී තිබීම නීතියේ ආධිපත්‍යයට එරෙහිව එල්ලවන බලවත් පහරක් වේ. එම නිසා, රටෙහි පොදු යහපත තකා, මෙකී නීතිරීති ක්‍රියාවට නැංවීම අත්‍යාවශ්‍ය වේ.

ප්‍රධාන කාර්යාලය :- අංක 165, කින්සි පාර, කොළඹ - 08.
தலைமைக் காரியாலயம் :- இல 165, கின்சி வீதி, கொழும்பு - 08.
*Head Office* :- No 165, Kynsey Road, Colombo - 08.

*Tele* : +94 -11- 2694925, 2685980, 2685981
*Chairman* : 2696470
*Secretary* : 2689558
*Hotline* : 2689064

*Fax* : +94 11 2694924
*E-Mail* : *sechrc@sltnet.lk*
*Web* : *www.hrcsl.lk*

**ජාතික නීති පද්ධතිය යටතේ සහ ජාත්‍යන්තර මානව අයිතිවාසිකම්වලට අදාලව රජය විසින් පිළිගෙන ඇත්තාවූ බැඳීම් වලට අනුව, එවන් ප්‍රචණ්ඩකාරී ක්‍රියාදාමයන් වළක්වාලීම සහ ප්‍රචණ්ඩත්වය පෝෂණය කරන්නාවූ සහ** ප්‍රවර්ධනය කරන්නාවූ වෛරී කථනයන් පිටුදැකීම සඳහා පමා නොවී කටයුතු කිරීම රජයේ වගකීම වේ. එසේ කටයුතු කිරීමට අපොහොසත්වීම රටෙහි මානව අයිතිවාසිකම් ක්‍රියාදාමය මත කළු පැල්ලමක් වනු පමණක් නොව, අතිගරු ජනාධිපතිතුමන් විසින් විශේෂයෙන් අවධාරණය කර ඇති සංහිඳියා යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමෙහිලා බලවත් බාධාවක් වනු ඇත.

**මේ තත්ත්වය අනුව, මුස්ලිම් ප්‍රජාව සහ අනෙකුත් සුළුතර අන්‍යාගමිකයන් ඉලක්ක කොටගත් වෛරී සහ ප්‍රචණ්ඩකාරී කථන ප්‍රචාරයට පොළඹවන්නන්ට හා ප්‍රචණ්ඩකාරීව හැසිරෙන්නන්ට විරුද්ධව අවශ්‍ය සියළුම** පියවර ගන්නා ලෙස නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයට සහ පොලිස්පතිවරයාට කඩිනම් නියෝග නිකුත් **කරන මෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අතිගරු ජනාධිපතිතුමන් ගෙන් ගෞරව පූර්වකව අයැද සිටී.**

**සභාපතිනි**
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

**Dr. N. D. Udagama**
**Chairperson**
Human Rights Commission of Sri Lanka